## CI-01

**සිංහල භාෂාවේ ණ, න - ළ , ල අක්ෂර පිළිබඳ අද්‍යතන ගැටලු**

ධර්මා රාජපක්ෂ

සිංහල අධ්‍යයන අංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය

ණ,න - ළ, ල වාදය නොහොත් ණකාර – නකාර වාදය අපට මුල්වරට අසන්නට ලැබෙන්නේ ක්‍රි.ව 1902 දි ය. සරසවි සඳරැස නම් පුවත්පත හරහා මේ දීර්ඝතර ශාස්ත්‍රීයවාදය සිදු විය. ක්‍රි.ව.1987 දී යළිත් වතාවක් සිංහල භාෂාවේ ණ, න - ළ, ල අක්ෂර යෙදීමේ දි මතුවන ගැටලු සහ දුෂ්කරතා පිළිබඳ ව දිවයිනේ සිටින ඉහළ මට්ටමේ භාෂා ශාස්ත්‍රඥයන්ගේත් විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගේත් සහභාගිත්වයෙන් දින හතරක් මුළුල්ලේ ශාස්ත්‍රීය සම්මේලනයක් පැවැත්විණි. මේ කුමන අයුරින් වාද විවාද පැවතියත් මේ සම්බන්ධ ගැටළුව අද වනතුරුත් නිරාකරණය වී නැත. 2008 වසරෙහි සාහිත්‍ය සම්මානය දිනා ගත් “අටවක පුත්තු” නම් නවකතාවේ මූර්ධජ “ණ” සහ මූර්ධජ “ළ” යන අක්ෂර එකක්වත් දක්නට නොමැත. අද්‍යතන බොහෝ පුවත්පත්වලින් මේ පිළිබඳ විවෘත සංවාද දියත් වෙන අයුරු ද දක්නට ලැබෙයි. එක ම ශබ්දයක් දෙන අක්ෂර දෙකක් සිංහල හෝඩියට අවශ්‍ය නැතැ යි ඇතැමෙක් පවසති. සාම්ප්‍රදායික ණ, න - ළ , ල යෙදීමේ ක්‍රමවේදය පිළිබඳ ව විධිමත් නිරීක්ෂණයක යෙදෙමින් මේ නවීන ගැටලු විමර්ශනය කිරීම මේ අධ්‍යයන පත්‍රිකාවේ අරමුණ වෙයි.

යොමු වචන: ණ, න සහ ළ, ල යෙදීමේ පිළිගත් සාම්ප්‍රදායික රීති , අටවක පුත්තු නම් නවකතාව, බස නැසීම සහ බස රැකීම